**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2020**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස් වේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 8) අනුව ගිණුම්ගත කළ යුතු නමුත් 2020 ජනවාරි 01 දින වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.239,502,566ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවන කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට 2015 වර්ෂය තුල කටයුතු කළද එය නිවැරදි ආකාරයෙන් සිදුවී නොතිබූ හෙයින්, එම ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම්වලට ගැනීම සිදු නොවීය. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒ අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

ගිණුම් විෂයයන් 03ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව වටිනාකම අතර රු.8,635,868ක වෙනසක් නිරීක්ෂණය වූ අතර සැසඳීම් කර ගිණුම්වල නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------- | ----------------------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අබලි ද්‍රව්‍ය හා අනෙකුත් මිලදී ගැනීම් සඳහා ගෙවන ලද රු.64,219,945ක් වූ පෙර ගෙවුම් අත්තිකාරම් මුදලින් 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයකර ගැනීමට නොහැකිව රු.16,880,725ක මුදලක් පැවතුණි. මේ තුළ අබලි ද්‍රව්‍ය මිලදීගැනීම් සඳහා ගෙවන ලද රු.28,192,542 ක් වූ පෙරගෙවුම් මුදලින් 2009 වර්ෂයේ සිට 2019 වර්ෂයට අදාලව අයකර ගැනීමට නොහැකිවූ රු.6,474,386ක මුදල්ද පැවතුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට හෝ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර දෙකකට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.18,578,830 ක වෙළඳ ණයගැති හා වෙනත් ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------ | ------------------------------------ | ---------- |
| වසර දෙකකට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 22,568,529ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | සැපයුම්කාර ආයතන වලට ගෙවීම් නිදහස් කිරීමේදී රඳවාගත් මුදල්ය. එම සැපයුම්කාර ආයතන වෙතින් ඉදිරිපත් වන ඉල්ලීම් අනුව මෙම රඳවාගත් මුදල් නිදහස් කරනු ලැබේ. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| -------------- | --------------- | ------------------------------- | -------- |
| 2013 වර්ෂයේ අනුමත කළ මණ්ඩලයේ බඳවාගැනීමේ පරිපාටිය | (i)අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු අලෙවි අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2015 ජුනි 26 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.9,229,428 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | පරීක්ෂණ මණ්ඩලය මගින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. තවද , 2021.10.06 දාතම සහිත ලිපිය මගින් අලෙවි අධ්‍යක්ෂකගේ වැඩ තහනම් කොට ඇත. | අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ii)අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) ලෙස සිටි නිලධාරියකු අධ්‍යක්ෂ (කාර්මික ජනපද) තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදීත් 2013 ජනවාරි 01 දින සිට බඳවාගෙන තිබුණි. එදින සිට 2020 සැප්තැම්බර් දක්වා තනතුරු දෙකෙහි වැටුප් හා දීමනා අතර වෙනස දළ වශයෙන් රු.3,977,595 ක් විය. | මේ සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටී. තවද, මෙම නිලධාරියා මේ වන විට මණ්ඩලයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත. | අනුමත බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,022,747ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,828,307 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,851,054 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම වැඩිවීම හා විකුණුම් පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-----------------------------------------------------------------------

| | 2020 (රු.) | 2019 (රු.) | වෙනස (රු.) | % |
|---|---|---|---|---|
| ආදායම (අබලි ) | 24,576,340 | 241,885,519 | 5,690,821 | 2.4 |
| <u>විකුණුම් පිරිවැය</u> | | | | 6.6 |
| සෘජු ශ්‍රමය | 4,178,580 | 8,287,193 | 4,108,613 | |
| වක්‍ර අමුද්‍රව්‍ය | 483,643 | 4,764,080 | 4,280,437 | |
| අබලි වපෘතිය විකුණුම් පිරිවැය | 165,876,436 | 174,649,110 | 8,772,674 | |

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අබලි මුළු ආදායම සියයට 2.4 කින් වැඩිවී තිබූ අතර විකුණුම් පිරිවැය සියයට 6.6 කින් අඩුවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

--------------------------

| අනුපාතය | 2020 | 2019 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1:1.3 | 1:1.3 |
| දළ ලාභ අනුපාතය | 38.39 | 31 |
| ශුද්ධ ලාභ අනුපාතය | 3.52 | (2) |

ශුද්ධ ලාභ අනුපාතය වැඩිවීමට වර්ෂයේ විකුණුම් ආදායම වැඩිවීම හා විකුණුම් පිරිවැය අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ආහාර රසායනාගාර පරීක්ෂණ සේවාවන් ලබා දීම තුලින් ව්‍යාපාර ප්‍රවර්ධනය හා සංවර්ධනය මෙන්ම ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය දේශීය හා අන්තර්ජාතික වෙළඳපොළට උසස් කිරීම ආදී අරමුණු පෙරදැරිව ආහාර රසායනාගාරය ඉදිකර තිබුණි. 2019 දෙසැම්බර් මස සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල ආහාර රසායනාගාරයට ලද පරීක්ෂණ වර්තා 246 කින් රු.2,380,630ක් උපයා තිබුණද මෙම රසායනාගාරය ස්වාධීනව ක්‍රියාත්මක නොවී වෙනත් බාහිර ආයතනයක් සමඟ සම්බන්ධ වී ක්‍රියාක්මක වීම සිදුවී තිබූ බැවින් සිදුකළ පරීක්ෂණ ආදායමින් සියයට 80ක් බාහිර ආයතනයට ගෙවීමට සිදුවී තිබුණි. | රසායනාගාරයක පරීක්ෂා කිරීමේ හැකියාව මත විද්‍යාගාරයකින් වඩා හොඳ සේවාවක් ලබාදීමට උප කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කළ යුතු අතර ශ්‍රී ලංකාවේ සිදු නොකරන පාරාමිතින් සේවාදායකයෙකු විසින් ඉල්ලා සිටින විට වෙනත් රටකින් වුවද උප කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සේවාව ලබාදීමට සුදුසුවේ.<br>උප කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කිරීමෙන්, අත්සන් කරන ලද ගිවිසුම අනුව මණ්ඩලය සඳහා අනෙකුත් පරීක්ෂාවන් පරිදිම ආදායම බෙදී යන බැවින් ආදායම වෙනස් වන්නේ නැත. | ආයතනයට ආදායම් උපරිම වන ආකාරයට ගිවිසුම් වලට එළඹිය යුතුය. |
| (ආ) | ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ වන්කානේ හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පන්සල්ගොඩ ගම්මානවලට බෙදාහැරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගබඩාව මගින් නිකුත් කර ඇති වටිනාකම රු.5,556,411 ක භාණ්ඩ 2021 ජූලි මස අවසන් වන විටත් ප්‍රතිලාභීන් අතර නොබෙදා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල දිස්ත්‍රික් කාර්යාලයන්හි ගබඩා කර පැවතිණි. | ගම්මානය සඳහා බෙදා හැරීමට මිලදී ගෙන ඇති උපකරණ බෙදා හැරීම සඳහා අදාල දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දී ඇත. | මිලදීගත් භාණ්ඩ අප්‍රමාදව බෙදාහැරිය යුතුය. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනවල තත්ත්වය වැඩිදියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී රු.9,318,026 කට මිලදී ගෙන තිබූ රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රයෙන් 2020 පෙබරවාරි දක්වා කර්මාන්තකරුවන් 28 දෙනෙකු සඳහා පුහුණුවීම් ලබාදීම හා තාක්ෂණ උපදෙස් ලබාදී රු.63,000ක අදායමක් පමණක් උපයා තිබුණි. එසේම මෙම යන්ත්‍ර | ➢ මෙම යන්ත්‍ර උපයෝගි කරගනිමින් මෙතෙක් කර්මාන්තකරුවන් 250 – 300 අතර දැනුවත් කිරීම් කර විදේශීය වෙළඳපල වෙත හා ආනයනික භාණ්ඩ එම ප්‍රමිතියෙන් මෙරට තුළ නිපදවීමට වැඩසටහන් හා ප්‍රායෝගික පුහුණු කිරීම් කලද ඔවුන්ගේ යොමුවීම පසුගාමී වී ඇත.<br>➢ මෝටර් රථ අමතර කොටස් නිෂ්පාදකයන්ගේ සංගමය සමඟ ගෙන්වන භාණ්ඩ එම තත්ත්වයෙන් මෙහි නිපදවීම සම්බන්ධව " සම්මත | ආයතනයේ වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිෂ්පාදන ස්වරූපයේ යන්ත්‍රයක් වුවත් මිල දී ගත් දින සිට පුහුණුව ලබා දීම් හැර වෙනත් කිසිදු නිෂ්පාදන කාර්යයක් සිදු කර නොතිබුණි. 2020 පෙබරවාරි 21 න් පසු මෙම යන්ත්‍රය ක්‍රියාකාරිත්වයට ගෙන නොතිබීම හේතුවෙන් විගණිත දින වන 2021 ජූලි 30 දින දක්වා එය අක්‍රීය තත්වයට පත් වී තිබුණි. ඉහළ ධාරිතාවයකින් යුත් මෙම යන්ත්‍රය නිෂ්පාදන කටයුතු සඳහා දායකත්වයක් ලබා ගැනීමට අදාල වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම නිසා මණ්ඩලයට ලබාගත හැකිව තිබූ ආදායමද අහිමි වී ගොස් තිබුණි. | ක්‍රියාවලිය - sop "ක්‍රියාත්මක කිරීමට අනුගාමීව භාණ්ඩ නිෂ්පාදනයට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටද නියමිතය.<br>➢ දැනට යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු කරගෙන යනු ලැබේ. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය ස්ථාපිත කර ඇති හෙක්ටයාර් 1.2953 ක පමණ ඉඩම හා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇති අක්කර 13 රූඩ් 03 පර්චස් 34 ක ප්‍රමාණයක ඉඩම්වල අයිතිය මණ්ඩලය සතු කර ගැනීමට නොහැකි වී ඇත . මෙම දේපළ සඳහා විශාල වාණිජ වටිනාකමක් ඇතත් වටිනාකම් ගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට මේ දක්වා නොහැකිවී තිබුණි. ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති භූමියෙහි නව බිම ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් 3/4 ක ප්‍රමාණයක පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යෑම සිදුවන අතර ඔවුන්ගෙන් කිසිදු බිම් කුලියක් හෝ ගොඩනැගිලි කුලියක් අයකර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි. | ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩමේ මුල් අයිතිකරු සොයා ගැනීමට නොහැකිවීම නිසා උක්ත ඉඩම කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පවරාදීමේ කටයුතු නිසි ආකාරව සිදුකර ගැනීමට නොහැකි වී ඇත.<br>නව බිම් ඉඩම මණ්ඩලයට පවරාදීම සඳහා කැබිනට් අනුමැතිය තිබුණද, එකී ඉඩමේ නෛතික හිමිකම මෙම මණ්ඩලය වෙත මේ වන තෙක් මොරටුව ප්‍රාදේශීය ලේකම් විසින් පවරා නොමැති බැවින් එකී පරිශ්‍රය තුළ පවතින ව්‍යාපාර වලින් කුලී අයකර ගැනීමට නොහැකිවී ඇත. | මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය සතු කාර්මික ජනපද 18 හි බිම් කොටස් 761 ක් පවතින අතර 2020 දෙසැම්බර් 31 දිනට බිම් කොටස් 90 ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් එම ඉඩම් කොටස් නිශ්කාර්යව පැවතුණි. එසේම ජනපද 14ක බිම් කොටස් 47ක කර්මාන්ත ක්‍රියාත්මක නොවී වසා දමා තිබුණි. තවද ජනපද 03 ක කර්මාන්ත සඳහා ලබාදුන් බිම් කොටස් 43කින් බිම් කොටස් 11ක් පදිංචිය සඳහා භාවිතා කර තිබුණි. | හිස් බිම් කොටස් පැවරීම සඳහා නව ආයෝජකයන් දැනුවත් කරමින් පවතින අතර ක්‍රියාත්මක නොවන කර්මාන්ත නැවත ආරම්භ කිරීම හෝ නව ආයෝජකයන් වෙත පවරා දීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සමීක්ෂණයක් ආරම්භ කර ඇත. එසේම 1990 දශකයේ බිම් කොටස් පවරාදීම සිදුකර තිබුණද කර්මාන්ත ආරම්භ නොකර පදිංචිය සඳහා භාවිතා කර තිබුණි. | බිම් කොටස් කර්මාන්ත කරුවන්ට බෙදා දීමට හා ඵලදායී කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය | රොබෝ යන්ත්‍ර ඇතුළු අනෙකුත් උපකරණ 2020 නොවැම්බර් 16 | පොදු එකහත්වයක් |

සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර ගැනීමට හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 40 ක් පමණ වැය කර රු.මිලියන 80ක් පමණ වටිනා රොබෝ යන්ත්‍ර 04ක්, සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 ක් ඇතුළුව ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගෙන සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 හැර අනෙක් උපකරණ 2018 මාර්තු වන විට එහි ස්ථාපනය කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා කාලයට මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද සමාගමක් වශයෙන් ලියාපදිංචි කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙහි අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරණ ගැසට් පත්‍රය මඟින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. තත්ත්වය එසේ තිබිය දී 2020 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/1725/320/025 පරිදි මෙම මධ්‍යස්ථානයෙහි පැවති යන්ත්‍රෝපකරණ කොළඹ 10, ට්‍රේස් සිටි වෙත ගෙන යාමට තීරණය කර තිබුණි.

මිලදී ගත් දින සිට මෙම රොබෝ යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ විගණිත දිනය වන 2021 අගෝස්තු 30 දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතීමෙන් අභ්‍යන්තර මළබැඳීම් වලට ලක්ව ඇති බවත් සමහර මෘදුකාංග සඳහා රහස්පද ඇතුලත් කර ඇති බැවින් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බවත් අනාවරණය විය. ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම රොබෝ තාක්ෂණය සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණද මෙතෙක් එය ඉටුකර නොතිබුණි.

අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉවත් කරගන්නා බව දැන්වුවද අද දින වන තෙක් කිසිවක් සිදුනොවූ බවත් හැකි ඉක්මණින් එම උපකරණ ඉවත් කර පරිශ්‍රය නිදහස් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්තුමාට නැවත ඉල්ලීම් කල බවත් කාරුණිකව දන්වා සිටිමි. සියළු ක්‍රියාත්මකවීම් රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා නියෝග පරිදි සිදුකරන බවත් දන්වමි.

මත නැවත ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 අගෝස්තු 02 දින මෙම රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානයට මිලදීගත් රු.35,788,924 ක් වටිනා සීඑන්සි ලේත් සහ 5 axis මිලින් යන්ත්‍ර (CNC Lathe & Milling Machine) දෙක, මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇති "නවබිම" ගොඩනැගිල්ලෙන් බැහැරව කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ ගොඩනැගිල්ලක ස්ථාපිත කර තිබුණි. එහි පිරිවිතර ඇගයීම් කරන අවස්ථාවේදී 5 axis මිලින් යන්ත්‍රය මඟින් සංකීර්ණ කාර්යයන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂිත ඉංජිනේරුවකු මේ සඳහා අවශ්‍ය බව හා එසේ නොමැති විටෙක අදාල යන්ත්‍ර නිශ්කාර්ය හෝ ඌන උපයෝජනය වන බව සඳහන් කර තිබුණද මේ වන තෙක් උක්ත කාරණය සඳහා ඉංජිනේරුවරයකු බඳවා ගෙන නොතිබුණු අතර 5 axis භාවිතා කිරීමේ පුහුණුවද නිලධාරීන්ට ලබා දී නොතිබුණි. | ලේත් සහ මිලින් යන්ත්‍ර මේ වන විට පලදායි ලෙස ක්‍රියාවේ යොදවා ඇත. ඒ සඳහා ඉංජිනේරුවරයෙකු මේ වනවිට වැඩ පැවරුම් යටතේ සේවයේ යොදවා ඇති අතර අවශ්‍ය පුහුණුව ලබාදීමටත් ඒ තුළින් වැඩ ඇණවුම් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනු ලැබ ඇත. තවදුරටත් දිගු කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින නියමිත සේවක ප්‍රමාණයෙන් භාගයකටත් වඩා වැඩි නිපුණ ඉංජිනේරු සේවක හිඟය පියවීමට යෝජනා කරමු. | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අබලි ලෝහ කළමනාකරණය පිළිබඳ 2013 සකස් කළ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අබලි ලෝහ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වෙත සාධාරණ පදනමක් යටතේ බෙදා හැරීම සිදුකළ යුතු බව දක්වා තිබුණද මණ්ඩලය විසින් 2020 වර්ෂයේදී කර්මාන්තකරුවන්ට විකුණූ වටිනාකම රු.43,382,731ක අබලි ට්‍රාන්ස්ෆෝමර් වලින් සියයට 52 ක් එනම් රු.22,453,167ක් ට්‍රාන්ස්ෆෝමර් ඉල්ලීමක් නොකළ හෝ නිර්දේශයක් නොකළ කර්මාන්තකරුවන් තිදෙනෙකුටද සියයට 48 ක් එනම් රු.20,929,564ක් කර්මාන්තකරුවන් නම දෙනෙකුටද ලබා දී තිබුණි. එසේම මිලදීගෙන තිබූ ට්‍රාන්ස්ෆෝමර් ඔයිල් ලීටර් 40,150 කින් සියයට 37ක ප්‍රමාණයක් වන ලීටර් 15000ක් කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවකු නොවන පුද්ගලයෙකුට ලබාදී තිබුණි.<br>එසේම වර්ග 06 ක යකඩ අබලි කිලෝ ග්‍රෑම් 1,062,816 ක් විකුණා තිබුණද ඒවා ඉල්ලුම් කරන ලද කර්මාන්තකරුවන් 61ක් අතරින් කිලෝ ග්‍රෑම් 1,455,000 ක් ඉල්ලුම් කළ කර්මාන්තකරුවන් 14 කට කිසිවක් ලැබී නොතිබුණා මෙන්ම එම අයිතමය ඉල්ලුම් නොකළ කර්මාන්තකරුවන් 21 කට කිලෝ ග්‍රෑම් 35,755 ක් ලබා දී තිබුණි. Furnace Oil ලීටර් 14,970 විකුණා තිබුණද ඒවා ඉල්ලුම් | සමහර අවස්ථාවලදී ආයතනවල එක් අමුද්‍රව්‍යයක් ලබාදෙන විට එම ප්‍රධාන අමුද්‍රව්‍ය සමඟ තවත් අමුද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් ලබාදෙන අවස්ථා පවතී. එම අවස්ථාවලදී එම සුළු අමුද්‍රව්‍ය ප්‍රමාණ අනිවාර්යයෙන් ඉන් ඉවත් කරගත යුතු නිසාත් වෙනත් ලියාපදිංචි කර්මාන්තකරුවකු වෙත ප්‍රවාහන ගාස්තු ගෙවා ඉතා සුළු ප්‍රමාණයක් ලබාදීම අපහසු නිසා එම සුළු අමුද්‍රව්‍ය ප්‍රමාණය ප්‍රධාන අමුද්‍රව්‍ය ලබාගන්නා කර්මාන්තකරු හට ලබාදීම සිදු කෙරේ. මේ නිසා අදාල අමුද්‍රව්‍ය කර්මාන්තකරුවන්ට නොලැබී යාමට හැකියාවක් ඇත. | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත සංවර්ධනය සඳහා අබලි ලෝහ සාධාරණ පදනමකින් බෙදාහැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළ කර්මාන්තකරුවන් 40කගෙන් 12 කට පමණක් එම අබලි ද්‍රව්‍ය ලබා දී තිබූ අතර මුළු අබලි ලෝහ ලියාපදිංචි කර්මාන්තකරුවන් 296කගෙන් 44 දෙනෙකුට කිසිදු අබලි අයිතමයක් ලබා දී නොතිබුණි. | | |
| (ඊ) | උණ දැව භාවිතයෙන් පිරිවැය ඵලදායී වන පරිදි ප්‍රමාණවත් ප්‍රමාණවලින් වෙළඳපලට සුදුසු ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම මඟින් ආදායම, රැකියාව සහ ජීවනෝපායට ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ මූලික අරමුණින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා යුනිඩෝ ආයතනය ඒකාබද්ධව උණ දැව ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2019 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල පරිශ්‍රයේදී මෙම ව්‍යාපෘතියට අදාළව යුනිඩෝ ආයතනය විසින් ලබාදුන් රු.7,438,682ක මුදලක් වැයකර දින 42ක් තුල ප්‍රතිලාභීන් 18 දෙනෙකුට වැඩමුළු 5ක් පවත්වා තෝරාගත් ප්‍රතිලාභීන් 11 දෙනෙකුට උණ දැව වලින් විසිතුරු භාණ්ඩ හා සමරු භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා රු 2,349,199 ක් වටිනා උපකරණ කට්ටල 2020 ජූලි මස බෙදා දී තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා උණ දැව ලබා ගැනීමේ දුෂ්කරතා, උණ දැව ප්‍රවාහනයට වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම, ලබා දී ඇති උපකරණ භාවිතා කිරීමට අපහසු වීම, ආදි හේතු නිසා පිරිවැය ඵලදායී ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම ප්‍රතිලාභීන්ට දුෂ්කර කාර්යයක් වී තිබූ බැවින් ඔවුන්ගේ ආදායම ඉහළ යාමක් හෝ ජීවනෝපායට ධනාත්මක බලපෑමක් ඇති කිරීම ගිලිහී ගොස් තිබුණි. ඒසේම මෙම ව්‍යාපෘතිය මඟින් හඳුනාගන්නා ලද ප්‍රතිලාභීන් 320කට ජීවනෝපාය සඳහාත් අමුද්‍රව්‍ය සපයන්නන් 60 දෙනෙකුට සෘජු ප්‍රතිලාභ ලබා දීමත් අපේක්ෂා කර තිබුණ ද එසේ සිදු වී නොතිබුණි.<br>උණ දැව මගින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ ද්විතීයික අරමුණක් වන අතර ඒ සඳහා ලක්සල වඩු කර්මාන්ත ශාලාව පිහිටි ගොඩනැගිල්ලක් රු.273,360ක වියදමක් දරා අළුත්වැඩියා කර යුනිඩෝ ආයතනය විසින් ලබාදුන් ඇමරිකානු ඩොලර් 101,130ක් වටිනා යන්ත්‍ර උපකරණ 2020 මැයි 28 දින එම ගොඩනැගිල්ලේ ස්ථානගත කර තිබුණ ද විගණිත දිනය වන 2021 ජූනි 30 දින වන | ප්‍රතිලාභීන්ට ලබාදිය යුතු උපකරණ පිළිබඳව නිර්දේශ ලබාදෙන ලද්දේ UNIDO ආයතනයේ නිලධාරින් විසිනි.<br>උණ දැව මිලදී ගැනීම , ප්‍රවාහනය හා වෙළඳපොළ :<br>උණ දැව කැපීම හා ප්‍රවාහනය බලපත්‍ර ලබාගැනීමේදී සිදුකළ යුතු නෛතික ක්‍රියාවලිය නිසා ව්‍යවසායකයන්ට අපහසුතා හා ප්‍රමාදයන් සිදුවන බැවින් මණ්ඩලය විසින් වන සංරක්ෂණය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට උණ දැව කැපීම ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා දීමේදී කඩිනමින් සහ ප්‍රමුඛතාවයකින් යුතුව ඒවා ලබා දෙන ලෙස සියළු දිසා වන නිලධාරීන් වෙත අංක H3/10/04/2020 හා 22/12/2020 දින දරණ ලිපියෙන් යවා ඇත.<br>යෝධ උණ විශේෂය බහුල මධ්‍යම පළාතේ සිට අත්හදා බැලීම් කටයුතු සඳහා එම වර්ගය මහනුවර ප්‍රදේශයේ සිට ගෙන ඒමේදී ප්‍රවාහන ගාස්තුව සඳහා වැඩි වුවත් ප්‍රාදේශීය මට්ටමේදී කර්මාන්තකරුවන්ට මෙම වියදම අවම වනු ඇත.<br>පුහුණුලාභීන් නිපදවන අත්කම් භාණ්ඩ සඳහා ප්‍රධානතම වෙළඳපොල ඇත්තේ සංචාරක කර්මාන්තය මත වේ. කොවිඩ් වසංගත තත්ත්වය නිසා දිවයිනේ සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම බිඳ වැටී ඇති අතර මෙම වෙළඳපොල, සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීමත් සමග නිරාකරණය වනු ඇත.<br>මධ්‍යස්ථානය 2020.12.21 විවෘත කළත් 2020 හා 2021 වර්ෂ වලදී ද පැතිරෙමින් තිබූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත දිවයින තුල සාකච්ඡා , සම්මන්ත්‍රණ , පුහුණු වැඩසටහන් පැවැත්වීම , වසංගත තත්ත්වය තුල රජය විසින් තහනම් කර ඇත. වසංගත තත්ත්වය පහව යාමෙන් පසුව | ව්‍යාපෘතියේ අරමුණු කඩිනමින් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විටත් උණ දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා පුහුණු කටයුතු ආරම්භ නොකිරීමෙන් එම යන්ත්‍රෝපකරණ නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතියට නිසි ඉලක්ක කරා පහසුවෙන් යාමට හැකි වනු ඇත. | |

**3.3 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආහාර රසායනාගාරයේ පළමු මහලේ පිහිටි ක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය ඉදිකිරීම් අවසන් වන විට ස්ථාපනයට සුදුසු උපකරණ මිලදී ගැනීමට කටයුතු සැලසුම් කළ යුතු වුවත් මෙම උපකරණ 2019 වර්ෂයේ මිලදීගෙන තිබුණු අතර රු.6,203,670ක් වටිනා උපකරණ 2021 ජූලි අවසන් වන විටත් ඇසුරුම් සමග නිශ්කාර්යව බිම්මහලේ රඳවා තිබුණි. | මෙම වසරේ දෙසැම්බර් මස වන විට උපකරණ සියල්ල ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ″නංවමු ලංකා″ ජාතික වැඩසටහන යටතේ විරැකියාව දිළිඳුකම වැනි උචිත නිර්ණායක පදනම් කරගනිමින් දිවයිනේ සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් තෝරා පුහුණු වැඩසටහන් පවත්වා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මිලදීගෙන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂකට භාරදීමෙන් පසු නියෝජ්‍ය අධ්‍යක්ෂක මෙම වැඩසටහනට සම්බන්ධ අනෙකුත් ආයතන හා එක්ව එම භාණ්ඩ ප්‍රතිලාභීන්ට බෙදාහැරිය යුතු විය. ඒ අනුව 2019 අග හා 2020 මාර්තු මසට පෙර මිලදී ගත් රු.මිලියන 55.8 ක් වටිනා භාණ්ඩ බදුල්ල, මාතලේ හා මහනුවර දිස්ත්‍රික් ප්‍රතිලාභීන්ට බෙදාහැරීම සඳහා 2020 අගෝස්තු 18 දිනැති අභ්‍යන්තර සටහන් පත්‍රිකාවක් මගින් කාර්මික සංවර්ධන මණ්ඩල ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් තිබුණි. මේ සම්බන්ධයෙන් පරිපාලන, පුහුණු හා වෙනත් වියදම් ලෙස රු.16,772,403 ක් දරා දිවයින පුරා පුහුණු වැඩසටහන් පවත්වා තිබුණද මේ දක්වා එම භාණ්ඩ ප්‍රතිලාභීන්ට බෙදා නොදීමෙන් ඒවායේ වගකීම් කාලයද ඉක්මවමින් ගබඩා කිහිපයක නිශ්කාර්යව රඳවා තිබුණි. | දිස්ත්‍රික් තුනක පමණක් අදාල ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට තිබීම හා ප්‍රතිලාභීන් තෝරා ගැනීම තුල පැවති යම් යම් අපහැදිලි තත්ත්වයන්ද හේතු කොට වඩාත් සාධාරණ පදනමක සිට දිවයිනම ආවරණය වන පරිදි වඩාත් සුදුසුම ප්‍රතිලාභී පිරිසක් වෙත ලබාදීමේ අරමුණෙන් ප්‍රසම්පාදිත යන්ත්‍රෝපකරණ හා මෙවලම් ප්‍රධාන කාර්යාලීය ගබඩාව වෙත භාරගැනීමට කටයුතු කරන ලදී.<br>මෙම යන්ත්‍ර හා උපකරණ නැවත සුදුසු ප්‍රතිලාභීන් සඳහා බෙදාදීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/0577/320/017 අනුව අදාල යන්ත්‍ර හා උපකරණ ‟කර්මාන්ත පෝෂණයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගෘහ ව්‍යවසායක ජවය'' යන ව්‍යාපෘතිය යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දිවයිනේ සුදුසු ව්‍යවසායකයින් වෙත බෙදා දීමට ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන ඉදිරි වැඩසටහන් වලට සහයෝගය ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | වැඩසටහනේ අරමුණු ඉදිරියට ගෙන යාමට හා වත්කම් ප්‍රතිලාභීන්ට ඵලදායීව භාවිතා කිරීමට හැකිවන ලෙස භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 24 ක් වර්ෂ 1 ත් වර්ෂ 36 ත් අතර කාල පරාසයක සිට අක්‍රියව පවතින බවත්, එක් යන්ත්‍රයක් මිලදීගත් දින සිටම භාවිතයට ගෙන නොමැති බවත් අනාවරණය විය. | රබර් අංශයේ පවතින බොහෝ යන්ත්‍ර අංශය ආරම්භයේ දී සවිකරන ලද යන්ත්‍ර වේ. එම යන්ත්‍ර වල අළුත්වැඩියාවන්සඳහා අවශ්‍ය අමතර කොටස් දැනට වෙළඳපොලේ නොපවතින බැවින් අළුත්වැඩියා කටයුතු නැවතී ඇති අතර එම යන්ත්‍ර අළුත්වැඩියාවන් සඳහා යොදන මුදල් අනුව නවීනතම තාක්ෂණික යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම යෝග්‍ය වන අතර එවැනි යන්ත්‍රවලට සමරුපී යන්ත්‍ර ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම හරහා සහ බාහිර අරමුදල් මඟින් මිලදී ගැනීම් කෙරේ. | අත්‍යවශ්‍ය උපකරණ පමණක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.38,139,000 ක ඇස්තමේන්තුගත මුදලකට 2017 දෙසැම්බර් 19 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාරදී තිබුණද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් වෙත දින 301 කින් ඉදිකිරීම් නිම කිරීමට රු. 26,379,710ක වැට් රහිත මුදලකට කොන්ත්‍රාත්තුව භාරදීම 2019 ජනවාරි 21 දක්වා ප්‍රමාදවී තිබුණි. ගොඩනැගිල්ලේ පළමු මහළ පමණක් ඉදිකිරීමට මණ්ඩලයේ කළමණාකාරීත්වය ගත් තීරණය හේතුවෙන් අත්තිකාරම් වශයෙන් රු.2,914,000 ක් හා රු.2,964,640 ක් බිල්පත් මඟින් ගෙවීම් සිදුකළද 2021 ජූනි වන විට ටෙන්ඩරය පවරා වසර 04 ක් ගතවී තිබුණද දෙමහල් ගොඩනැගිල්ලේ යෝග්‍ය අත්තිවාරමක් පමණක් ඉදි කර තිබුණි. 2021 ජූනි 26 දින නැවත ටෙන්ඩර් කැඳවා 2021 අගෝස්තු 05 දින රු.15,035,958ක (වැට් රහිත) මිලට වෙනත් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් වෙත දින 186 කින් බිම්මහල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව භාරදී තිබූ අතර ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලය සතුව නොතිබියදී මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. | මේ වන විට 2021 වර්ෂයේ බිම්මහල ඉදිකිරීමට අදාළව ටෙන්ඩර් කැඳවා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉදිකිරීමට අදාළව උපදේශන හා අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. | කඩිනමින් ඉදිකිරීම් කටයුතු නිම කිරීම කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුර කණිෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක් වන නමුත් නඩු තීන්දුවක් පදනම් කරගෙන නිලධාරීන් 55 දෙනෙකු සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකාර වශයෙන් මධ්‍යම කළමණාකාර මට්ටම ලබාදී තිබුණද මෙම නිලධාරින් මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමේ අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු වුවත් 2021 ජූලි 30 දින වන විටත් එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 55 දෙනෙකු ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකරුවන් ලෙස මධ්‍යම කළමනාකරණ මට්ටමට පත් කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය අපේක්ෂා කළද එසේ නොලැබුණි. ඒ අනුව එම නිලධාරීන් විසින් අභියාචනාධිකරණය ඉදිරියේ CA (wrid) 122/2021 නඩුවක් ගොනුකොට තිබෙන අතර, එම නඩුව මේ වනවිටත් විභාග වෙමින් පවතී. | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | මහා භාණ්ඩාගාරයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ පූර්ණ අනුමැතියකින් තොරව මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති ඩිජිටල් මාධ්‍ය උපදේශකවරයකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් 2020 සැප්තැම්බර් 21 සිට මාස 6 කට පත්කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව පරිදි මණ්ඩලයේ ප්‍රතිරූපය ගොඩනැංවීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීමටත්, සමාජ මාධ්‍ය තුළ මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රචාරයක් ලබාදීමටත්, මණ්ඩලයේ අභ්‍යන්තර නිලධාරින්ගේ ඩිජිටල් සන්නිවේදනය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම හා වර්ධනය කිරීමත් ඔහු විසින් ඉටුකළ යුතු කාර්යයන් ලෙස දක්වා තිබුණි. මේ වෙනුවෙන් රු.60,000ක දීමනාවක් රු.50,000ක ප්‍රවාහන දීමනාවක් හා රු.16,440 ක ඉන්ධන දීමනාවක් ලෙස මාසිකව රු.126,440ක මුදලක් ලෙස මාස 06ක් වෙනුවෙන් රු.758,640 ක් ගෙවා තිබුණද මණ්ඩලයට පැමිණීම පිටවීම සම්බන්ධ තොරතුරු හා ඔහුට පවරන ලද කාර්යයන් ඉටුකළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | මණ්ඩලය විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට කරනු ලබන සේවාවන් පිළිබඳව රජයේ , පෞද්ගලික හා සමාජ ජාලා මාධ්‍ය තුළ ප්‍රචලිත කිරීමත්, ලක්කම් නිෂ්පාදන පිළිබඳ වෙළඳපල අවස්ථා පුළුල් කිරීමත් මණ්ඩලීය වෙබ් අඩවිය නවා හා ආකර්ශණීය ලෙස පවත්වාගෙන යාම වෙනුවෙන් බඳවා ගත් ඩිජිටල් මාධ්‍ය උපදේශකවරයා මාස හයක කොන්ත්‍රාත් කාලයෙන් පසු සේවය නිමවා මණ්ඩලයෙන් බැහැරව සිටී.<br>ඔහු උපදේශකවරයෙකු ලෙස යොදවා ගත් අතර කාර්ය මණ්ඩල සේවකයෙකු මෙන් ඔහුගේ දෛනික පැමිණීම හෝ පිටවීම සම්බන්ධ තොරතුරු අවශ්‍ය නොවීය. | තනතුරු ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය තුල පමණක් බඳවාගැනීම් කළ යුතුය. |
| (ඇ) | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සහකාර අධ්‍යක්ෂකවරු 8 දෙනෙකු ඇතුළුව | දැනට වැඩ බලන නිලධාරීන් පූර්ණ කාලීනව එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා 2018.08.13 හා 2019.03.18 දාතමින් ලිපි දෙකක් මගින් කළමනාකරණ සේවා | පුරප්පාඩු පිරවීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරින් 12 දෙනෙකු වැඩ බැලීමට පත් කර තිබූ අතර මෙයින් නිලධාරින් 8 දෙනෙකුගේ කාලය අවුරුදු 2 කට වඩා වැඩි විය. | දෙපාර්තමේන්තුවේ අවශ්‍ය අනුමැතිය සඳහා යොමු කළද ඒ සඳහා අදාළ අනුමැතිය නොලැබීය. | |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

---------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නිපදවනු ලබන භාණ්ඩ අලෙවිකරණ ක්‍රියාවලියට අදාල කටයුතු කිරීම, සේවා ප්‍රවර්ධනය කිරීම, ඉදිරි වෙළඳපල සමඟ සම්බන්ධතා පිහිටුවා ගැනීමට සහාය වීම ආදී අරමුණින් අලෙවි අංශය පිහිටුවා තිබුණද ප්‍රගතිය පරීක්ෂාවේදී ක්‍රියාකාරකම් 8 කින් 4ක් සිදුකර නොතිබුණි. සිදුකර තිබූ ක්‍රියාකාරකම් 4න් කර්මාන්තකරුවන්ට අවශ්‍ය අබලි ලෝහ අමුද්‍රව්‍ය සැපයීමේ ප්‍රගතිය සියයට 66ක් වුවද අනෙක් ක්‍රියාකාරකම 03හි ප්‍රගතිය සියයට 6ත් 20ත් අතර විය. අංශයේ ආදායමින් සියයට 95ක්ම අබලි ලෝහ අලෙවියෙන් ලබාගෙන තිබූ අතර අංශයේ අනෙකුත් අරමුණු ඉටුකර ගැනීමට අවධානය යොමුවී නොතිබුණි. | පසුගිය වර්ෂය පුරාවටම කොරෝනා වසංගතය පැවතීම නිසා ප්‍රදර්ශණ ආදි කර්මාන්තකරුවන් එක්රැස්වන කාර්යයන් සිදුකිරීමට නොහැකි විය. තවද අතුරු කොන්ත්‍රාත් ව්‍යාපෘතියට අදාලව රාජ්‍ය ආයතන වලින් නිසි පරිදි ඇණවුම් නොලැබුණි. | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ අනෙකුත් අංශ වලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවය සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමත්, සැකසීම හා කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා හා තක්සේරු වාර්තා සකස් කිරීමත්, දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ඉංජිනේරු අංශය පිහිටුවා තිබුණද මෙම අංශයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් කාර්යයන් 14 ක් ඇතුලත කාර්යයන් 5 ක ප්‍රගතිය සියයට 0 ක් වූ අතර අනෙකුත් කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 16 සිට 39 දක්වා පැතිර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසර තුලදී යන්ත්‍ර සේවාවන් සඳහා ලැබුණු ඉල්ලීම් අවම වීම, අත්‍යාවශ්‍ය සේවා නිර්ණායකයක ක්‍රියාත්මකවීම හා නිරෝධායන තත්ත්වයත්, ලබාදුන් ඉලක්කය සර්ව සම්පූර්ණ නොවීමට සෘජුව බලපෑ බව දැක්විය හැක. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රබර් භාණ්ඩ ව්‍යාපෘති හඳුන්වා දීම, රබර් භාණ්ඩ සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම, තත්ත්ව පරීක්ෂණ හා තත්ත්වය පරීක්ෂා කිරීම, රසායනික ද්‍රව්‍ය සැපයීම, රබර් කිරි සංයෝග, කෘත්‍රිම හා ස්වභාවික රබර් සංයෝග සැපයීම හා රබර් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුව ලබාදීමේ මූලික අරමුණින් පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය පිහිටුවා තිබුණද එහි ප්‍රගතිය පරීක්ෂාවේදී ක්‍රියාකාරකම් 8 කින් 2ක් සිදුකර නොතිබුණු අතර 3ක ප්‍රගතිය සියයට 50ට වඩා අඩු මට්ටමක පැවතිණි. | මෙහි සියළු ක්‍රියාකාරකම් කර්මාන්තකරුවන්ගේ ඉල්ලීමේ පරිදි ඉටුකරනු ලබන අතර අවසානයේ මානව සම්පත්වල හිඟකම ද ඊට බලපා ඇති අතර රටේ වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය ද හේතුවී ඇත. | - එම - |